# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,923/1 — 1970 සැප්තැම්බර් 13 වැනි ඉරිදා — 1970.9.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

### 1970 අංක 296/1

අ. ආ. කා. අංක සී. 314/70 (2).

1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 46 වැනි වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාරතුමා පහත සඳහන් පත්වීම් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ :

| | |
|---|---|
| 1. පාර්ලිමේන්තු මන්ත්‍රී, බර්නාඩ් සොයිසා මහතා | මුදල් ඇමති, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ආචාර්ය නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, මුදල් ඇමති ධුරයෙහි වැඩ බැලීමට. |
| 2. නිවාස හා ගොඩනැගිලි ගරු ඇමතිතුමන්ගේ පාර්ලිමේන්තු ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී, බමුණුසිංහ ආරච්චිගේ හින් බණ්ඩාර මහතා | නිවාස හා ගොඩනැගිලි ඇමති, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු පීටර් ජෙරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, නිවාස හා ගොඩනැගිලි ඇමති ධුරයෙහි වැඩ බැලීමට. |

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1970 සැප්තැම්බර් 13 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී ය.

9–822

---

### 1970 අංක 296/2

අ. ආ. කා. අංකය පී. 162/49(8).

1970 සැප්තැම්බර් 5 වැනි දින අංක 14,922/1 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ (අති විශෙෂ) පළ කරන ලද මගේ නිවේදනයේ සඳහන් විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, ආචාර්ය ජේ. බී. කැලේගම මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, තම රාජකාරිවලට අමතරව විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට, ආහාර කොමසාරිස්, ලංකා පරිපාලන සේවයේ බී. පී. ඩබ්. ඊ. ජේ. පී. සේනාරත්න මහතාගේ පත්වීම 1970 සැප්තැම්බර් 16 වැනි දින සිට නොව 1970 සැප්තැම්බර් 13 වැනි දින සිට යැයි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී ය.

9–813/1

686/1——ජේ 16,876—11,150 (70/9)

ජාතික පුස්තකාල හා ප්‍ර...

1970 අංක 296/3

අ. ආ. කා. අංක සී. 162/49 (8).

1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 51 වැනි වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාරතුමා පහත සඳහන් පත්වීම් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ :

| | |
|---|---|
| 1. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, ලංකා පරිපාලන සේවයේ සී. ඒ. කුරේ මහතා | මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම්, එම්. රාජේන්ද්‍ර මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, තම රාජකාරි වලට අමතරව 1970 සැප්තැම්බර් 13 වැනි දින සිට මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් වැඩ බැලීමට. |
| 2. නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ලංකා පරිපාලන සේවයේ එල්. එන්. ටී. මැන්ඩිස් මහතා | නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ වැඩ බලන ස්ථිර ලේකම්, ආචාර්‍ය ඒ. එම්. එන්. අමරකෝන් මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු තම රාජකාරිවලට අමතරව 1970 සැප්තැම්බර් 11 වැනි දින සිට නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට. |
| 3. ලංකා විශ්ව විද්‍යාලයේ වැඩබලන ලේකම්, එල්. ඩබ්ලිව්. මඩුගල්ලේ මහතා | 1970 සැප්තැම්බර් 11 වැනි දින සිට පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට. |
| 4. ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ අතිරේක ස්ථිර ලේකම්, ජී. ජී. ඩී. එස්. පී. ගුණතිලක මහතා | ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, මහාචාර්‍ය එච්. ඒ. ද ඇස්. ගුණසේකර මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, තම රාජකාරිවලට අමතරව 1970 සැප්තැම්බර් 13 වැනි දින සිට ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට. |

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1970 සැප්තැම්බර් 12 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේ දී ය.

9–813/2

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## 1952 ආහාර පාලන රෙගුලාසි යටතේ දැන්වීම

1952 ආහාර පාලන රෙගුලාසි 4 ශීර්ෂ ඊ 3 වැනි කාණ්ඩයට අනුව 25 වැනි වාරයේ සලාක පොත්වල පහත සඳහන් කූපන් පහත දක්වා ඇති කාල පරිච්ඡේද තුළ දී වලංගු බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් දන්වනු ලැබේ.

| කූපන් | | වලංගු කාලය |
|---|---|---|
| කූපන් අංක 4 හා 5 | ... ... | 1970.9.14 සිට 70.9.25 දක්වා |

අංක 4 හා 5 දරණ එක් එක් කූපන් සඳහා සහල් රාත්තල් 2 ක් නිකුත් කරනු ලැබේ. 1970.9.14 සිට 70.9.25 දක්වා කාලය තුළ ඕනෑම දිනක මේ හාල් රාත්තල් 4 ලබා ගත හැක. එය දත් මෙන්ම නොමිලේ ලබා ගත හැක.

| කූපන් | | වලංගු කාලය |
|---|---|---|
| කූපන් අංක 6 හා 7 | ... ... | 1970.9.26 සිට 70.10.4 දක්වා |

එක් එක් කූපනයකට සහල් රාත්තල් 2 ක් නිකුත් කරනු ලැබේ. ඉරට්ට සංඛ්‍යාර අංක දරණ කූපනය සඳහා නිකුත් කරන රාත්තල් 2 නොමිලයේ දෙනු ලබන අතර ඔත්ත සංඛ්‍යාර අංක දරණ කූපනය සඳහා නිකුත් කරන රාත්තල් 2 ක සඳහා ශත 75 ගණනේ ගෙවිය යුතු වේ. මේ මිල රට සැම තන්හිම පවතින මිලය වේ.

| කූපන් | | වලංගු කාලය |
|---|---|---|
| කූපන් අංක 8 හා 9 | ... ... | 1970.10.5 සිට 70.10.11 දක්වා |
| කූපන් අංක 10 හා 11 | ... ... | 1970.10.12 සිට 70.10.18 දක්වා |

අංක 6 හා 7 කූපන් පිළිබඳව වැඩ පිළිවෙල ඒ ඒ සතිවලට අවශ්‍ය වෙනස් කිරීම් සහිතව නැවත දන්වන තුරු ක්‍රියාත්මක වේ.

සී. ටී. එච්. අමරසේකර,
ආහාර පාලක.

1970 සැප්තැම්බර් මස 9 වැනි දින,
කොළඹ 2.

9–812

## රේගු නිවේදනය—අංක 61/9/459

ආදයම් සංරක්ෂණ ආඥාපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු මස 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1970 සැප්තැම්බර් මස 14 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

### රබර්

| | | රු. ශ. |
|---|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට | ... | 0 98 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව රාත්තලකට ... ... ... | ... | 0 03 |

ඒ. ඊ. පණ්ඩිතරත්න,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඊ. 781,
1970 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

9–815

---

## රේගු දැන්වීම—අංක 67/3/147

1967 නොවැම්බර් මස 22 වැනි දින අංක 14,775/17 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1968.2.22 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡේදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1970 සැප්තැම්බර් මස 14 වැනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොලෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් රුපියල් 1,197·97 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | අමු පොල්ගෙඩි 1,000 ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|---|---|---|
| රු. ශ. | | රු. ශ. | | රු. ශ. | | රු. ශ. |
| 352 36 | ... | 385 71 | ... | 327 56 | ... | 88 09 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥා පනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

ඒ. ඊ. පණ්ඩිතරත්න,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඊ. 744/22,
1970 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේදිය.

9–816

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

සැ.යු.—14,922/1 කාණ්ඩයේ අවසාන අති විශෙෂ ගැසට් අංකය 14,922/7 ය.